# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2260/71 – 2021 දෙසැම්බර් 31 වැනි සිකුරාදා – 2021.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (1) වැනි වගන්තිය යටතේ නියමය

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1390/11 හා 2005.04.27 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූද, 2005 අංක 38 හා 2005.04.26 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. මෙහි පහත විස්තර වන ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1390/11 හා 2005.04.27 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත සඳහන් 2005 අංක 38 හා 2005.04.26 වැනි දින දරන ආඥාව මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: LD/05/2005/VE/54.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: බගම/ප්‍රාලේ/ඉ2/01/2005.
2021 දෙසැම්බර් මස 10 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හල්පාතොට ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ජීප්/බීඩීඩී/96/37 හා 2001.11.01 දිනෙන් සංශෝධිත 2001.08.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – පෙඩ්රුස්වත්ත 'බී' කොටස– ප්‍රමාණය: හෙක්. 77.655ක්**

උතුරට: කේ. සැඩ්ලින් ප්‍රනාන්දු හිමිකම් කියන පෙඩ්රුස්වත්ත, ඥානවතී වික්‍රමසිංහ සහ තවත් අය හිමිකම් කියන පෙඩ්රුස්වත්ත, ආර්.එච්. රෆියෙල් හිමිකම් කියන පාඩියවෙල කුඹුර; නැගෙනහිරට: ආර්.එච්. රෆියෙල් සහ තවත් අය හිමිකම් කියන පාඩියවෙල කුඹුර, මාර්ගය, වර්නල් අබේසුන්දර හිමිකම් කියන බොරළුවෙ වත්ත, නමුණුකුල වතු සමාගම හිමිකම් කියන පෙඩ්රුස්වත්ත, ලක්දාස් ගොන්සාල් කෝරාල සහ තවත් අය හිමිකම් කියන පෙඩ්රුස්වත්ත, ඇළ, මාර්ගය සහ නමුණුකුල වතු සමාගම හිමිකම් කියන පෙඩ්රුස්වත්ත; දකුණට: නමුණුකුල වතු සමාගම හිමිකම් කියන පෙඩ්රුස්වත්ත, පී.එච්.සයිමන් සහ තවත් අය හිමිකම් කියන මඩකුඹුරමුල්ල සහ කේ.කේ. නන්දෝරිස් හිමිකම් කියන කැකිල්ලදූව; බටහිරට: කේ.කේ. නන්දෝරිස් හිමිකම් කියන කැකිල්ලදූව, ඒ.කේ.එඩී හිමිකම් කියන පෙඩ්රුස්වත්ත, රජය හිමිකම් කියන පෙඩ්රුස්වත්ත, පී.එච්.අමරදාස හිමිකම් කියන පෙඩ්රුස්වත්ත, ඒ.කේ.එම්.එස්. ජයනායක හිමිකම් කියන පෙඩ්රුස්වත්ත, ටී. ප්‍රේමදාස හිමිකම් කියන ගන්දර වත්ත, මාර්ගය සහ කේ. සැඩ්ලින් ප්‍රනාන්දු හිමිකම් කියන පෙඩ්රුස්වත්ත.

EOG 12-0355



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*